1165

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

# වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2015
Year End Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 07 | විෂයය / பாடம் / Subject: නාට්‍ය හා රංගකලාව | පත්‍රය / வினாத்தாள் / Paper: I, II | කාලය / காலம் / Time: පැය 1 වී.30 |

නම :- ........................................ විභාග අංකය :- ........................

උපදෙස්:
- I හා II යන කොටස්වලින් මෙම ප්‍රශ්න පත්‍රය සමන්විත ය.
- I කොටසේ සියලුම ප්‍රශ්නවලට හා II කොටසේ පළමු ප්‍රශ්නය ඇතුළු ප්‍රශ්න 03කට පිළිතුරු සපයන්න.
- I හා II ප්‍රශ්නපත්‍ර සඳහා මුළු ලකුණු 50ක් වන අතර, ප්‍රායෝගික පරීක්ෂණය සඳහා ලකුණු 50 ක් වශයෙන් මුළු ලකුණු 100කි.

## I - කොටස

- ප්‍රශ්න අංක 01 සිට 05 දක්වා දී ඇති වාක්‍ය, නිවැරදි නම් (✓) ලකුණ ද වැරදි නම් (×) ලකුණ ද යොදන්න.

01. ශාන්තිකර්ම බලිතොවිල් සඳහා වෙස්මුහුණු භාවිතා නොකරයි. ( )

02. ළමා චිත්‍රපටයක් නිෂ්පාදනය වන්නේ කැමරාව භාවිතයෙනි. ( )

03. ළමා නාට්‍යයක මුල, මැද, අග සහිත කතාවක් දක්නට නොලැබේ. ( )

04. ආංගික අභිනය සතර අභිනයට අයත් වේ. ( )

05. "සිංහබාහු" ජයලත් මනෝරත්නයන්ගේ නාට්‍යයකි. ( )

- ප්‍රශ්න අංක 06 සිට 10 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

06. ළමයින් සඳහා නිර්මාණය වූ කාටූන් චිත්‍රපටයක් නොවන්නේ,
(1) ටොම් ඇන්ඩ් ජෙරි (2) සින්ඩරෙල්ලා
(3) ස්වාමි සහ යහළුවෝ (4) ඇලිස් ඉන් ද වොන්ඩර් ලෑන්ඩ්

07. ළමා නාට්‍ය නිෂ්පාදකවරයෙකි,
(1) ජයලත් මනෝරත්න මහතා. (2) පාලිත ලොකුපෝතාගම මහතා.
(3) එදිරිවීර සරච්චන්ද්‍ර මහතා. (4) දයානන්ද ගුණවර්ධන මහතා.

08. නාට්‍යයක දී නළු නිළියන් පළඳිනු ලබන උපකරණ,
(1) රංග වස්ත්‍ර (2) රංගාභරණ (3) රංගභාණ්ඩ (4) වෙස්මුහුණු

09. ළමා නාට්‍යයක් නොවන්නේ,

(1) අළුත් යාළුවෙක් (2) නෙළුම් කුමාරි

(3) මනමේ (4) ටිකිරි මැණිකේ

10. ළමා වේදිකා නාට්‍යයක අඩංගු නොවිය යුතු ලක්ෂණය වන්නේ,

(1) චරිත කිහිපයකට සීමා වීම.

(2) සංකීර්ණ චරිත ඇතුළත් නොකිරීම.

(3) යහපත් නායකයා නාට්‍යය අවසානයේ පරාජය වීම.

(4) සරල බස් වහරක් තිබීම.

- ප්‍රශ්න අංක 11 සිට 14 දක්වා ප්‍රශ්න සඳහා **A** කොටසට ගැළපෙන පිළිතුර **B** කොටසින් තෝරා යා කරන්න.

| | A | B |
|---|---|---|
| 11. | නාට්‍ය ගීතය | වාචික අභිනය |
| 12. | රජ ඔටුන්න | ආංගික අභිනය |
| 13. | ඇවිදීම | සාත්වික අභිනය |
| 14. | සිනාසීම | ආහාර්ය අභිනය |

- ප්‍රශ්න අංක 15 සිට 20 දක්වා දී ඇති ප්‍රශ්නවලට ගැලපෙන පිළිතුර යොදා හිස්තැන් පුරවන්න.

15. අලුතින් යමක් නිර්මාණය කිරීමට පුද්ගලයාට ........................ ශක්තිය වැදගත් වේ.

16. නාට්‍යයක භාවිතා කරන රංග වස්ත්‍ර .................................. නමින් ද හඳුන්වයි.

17. නාට්‍ය සඳහා බාහිරින් එකතු කරගන්නා කලාවන් ........................................... කලාවන් වේ.

18. නාට්‍යයක කතා වස්තුව තුළින් මතුවන ප්‍රධාන අදහස ................................................. වේ.

19. ඉතිහාසය ආශ්‍රය කරගෙන නිර්මාණය වූ විවිධ ...................................... දක්නට ලැබේ.

20. නාට්‍යයෙහි අර්ථය ප්‍රේක්ෂකයා වෙත රැගෙන එන්නේ .................................. මගිනි.

(පරිකල්පනය, ජනශ්‍රැති, තේමාව, ආනුශංගික, වේෂභූෂණ, අනුකරණය)

## II - කොටස

- **පළමුවන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 03කට පිළිතුරු සපයන්න.**

01. පහත දැක්වෙන සංවාද ඛණ්ඩය ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

"ඔව්, එයා තමයි එයා ගෙවල්වලටත් බෝඩ් ලියනව. සෙල්ලම් කිරීම තහනම්, ශබ්ද කිරීම තහනම්, බෝල ගැසීම තහනම්, විහිලු කිරීම තහනම්, උස් හඬින් කතා කිරීම තහනම්, බල්ලන් ගෙන ඒම තහනම්, ළමයින් ගෙන ඒම තහනම්, කෑ ගැසීම තහනම්, හුස්ම ගැනීම තහනම්, අරක එපා. මේක එපා, අරක තහනම්, මේක තහනම්, එපා. එපා, තහනම්, තහනම්, හැමදේම එපා. හැමදේම තහනම් (ඔහු වේදිකාවෙන් පිටවේ.)

(1) මෙම දෙබස් ඛණ්ඩය අයත් නාට්‍යයේ නම හා එහි මුල් කෘතිය කුමක් ද?
(2) එම සිංහල නාට්‍යයේ අනුවාදකයා කවු ද?
(3) මෙම දෙබස කවුරුන් විසින් කියන ලද්දක් ද?
(4) මෙම දෙබසේ ඇති රංග විධානයක් ලියන්න.
(5) මෙම දෙබසින් මතුවන හැඟීම කුමක් ද?

02. (1) ළමා නාට්‍ය බෙදෙන ප්‍රධාන කොටස් දෙක කුමක් ද? (ල.02)
(2) ඔබ පාසලේ දී උගත් මීයන් සහ පූසන් අතර ගැටුමක් ඇතිවන ජනප්‍රිය ළමා වේදිකා නාට්‍යයේ නම කුමක් ද? එම නාට්‍යයේ රචකයා කවු ද? (ල.02)
(3) එම නාට්‍යයෙන් ඔබට ලැබෙන ආදර්ශයන් දෙකක් ලියන්න. (ල.06)

03. (1) ශ්‍රව්‍ය මාධ්‍යයක් සහ ශ්‍රව්‍ය දෘෂ්‍ය මාධ්‍යයක් නම් කරන්න. (ල.02)
(2) ඔබ නම් කළ ශ්‍රව්‍ය දෘෂ්‍ය මාධ්‍ය සහ වේදිකා නාට්‍ය අතර වෙනස්කම් දෙක ලියන්න. (ල.02)
(3) ළමුන් සඳහා නිර්මාණය වූ ජනප්‍රිය සිංහල ළමා චිත්‍රපට (කාටූන් නොවන) 03ක් නම් කරන්න. (ල.06)

04. (1) හඬ අභ්‍යාස සිදුකිරීම සඳහා උපයෝගී කරගත හැකි ග්‍රන්ථ දෙකක් නම් කරන්න. (ල.02)
(2) ශිථිලකරණය යනු කුමක් ද? (ල.02)
(3) ශිථිලකරණ අභ්‍යාසයක් ඔබ පාසලේ සිදුකළ ආකාරය කෙටියෙන් ලියන්න. (ල.06)

05. (1) ඔබ පාසලේ උගත් ඓතිහාසික කතන්දර තුනක් නම් කරන්න. (ල.03)
(2) ඓතිහාසික කතන්දර අධ්‍යනයෙන් ඔබට ලැබිය හැකි ප්‍රයෝජන දෙකක් ලියන්න. (ල.02)
(3) ඓතිහාසික කතන්දරයක එන එක් චරිතයක් සඳහා උචිත සංවාද කොටසක් නිර්මාණය කරන්න. (ල.05)

06. (1) නාට්‍යයක හඬ උත්පාදනය කිරීම සඳහා යොදාගත හැකි සරල ද්‍රව්‍ය හෝ උපකරණ තුනක් සඳහන් කරන්න. (ල.03)
(2) ස්වභාවික පරිසරයේ ඔබ දැක ඇති කලාත්මක අවස්ථා තුනක් නම් කරන්න. (ල.03)
(3) ඉන් එක් අවස්ථාවක් පිළිබඳ පේළි හතරක කවියක් නිර්මාණය කරන්න. (ල.04)